LYCEUM
INTERNATIONAL SCHOOLS
WATTALA BRANCH
KNOWTHYSELF

20th Anniversary
LYCEUM WATTALA
2001 - 2021

# "20 වසරක"

## විප්ලවීය අධ්‍යාපනයේ ගමන්මඟ...





**අවිනිශ්චිත යථාර්ථවාදයට දිරි දෙන සිහිනය - වත්තල ජාත්‍යන්තර පාසලේ 20 වන සංවත්සරය.**



ගත වූ වසර 20ක කාලය තුළ වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසලේ ජයග්‍රහණයේ ගමන් මඟ හෙළිදරව් කෙරෙන මතක මංතීරුව ඔස්සේ අප සමඟ ගමන් කරන ලෙස ඔබට ආරාධනා කරන්නෙමු.

ලයිසියම් ජාත්‍යන්තර පාසලේ සහෝදරත්වය සනිටුහන් කරමින් එහි නිර්මාතෘ ආචාර්ය මොහාන් ලාල් ග්‍රේරු මහතාගේ සහ සම්බන්ධීකරණ විදුහල්පතිනි ආචාර්ය කුමාරි ග්‍රේරු මහත්මියගේ මඟ පෙන්වීම මත 2001ක් වූ බිනර මස 3 වෙනිදා එහි තෙවන ශාඛාව ලෙස ශක්තිමත්, සෞඛ්‍ය සම්පන්න මූලයක් වත්තල දී රෝපණය කිරීම ලක් ඉතිහාසයේ රන් අකුරින් ලියවුණු සංසිද්ධියක් විය. වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසලේ ආරම්භය ඒ. එස්. පී ලියනගේ මාවතේ අක්කර හතක ඉඩමක, පූර්ව ප්‍රාථමික සහ 1 සිට 5 ශ්‍රේණිවල ප්‍රාථමික සිසුන්ට පමණක් අධ්‍යාපනය ලබා දුන් පන්ති කිහිපයකින් සමන්විත තනි මහල් ගොඩනැගිල්ලකින්ද, පුස්තකාලයකින්ද, කාර්යක්ෂම හා ශක්තිමත් ඉගැන්වීමේ හා ඉගෙනුම් පරිසරයක් ඇති කිරීමේ දැක්මකින් යුතු ගුරුවරුන් දෙනෙකුගෙන්ද සිදු විය.

ලයිසියම් ජාත්‍යන්තර පාසල මඟින් සිදුවන අධ්‍යාපන මෙහෙවර තුළින් ඉතා වේගයෙන් සංවර්ධනය වන වත්තල නගරයේ ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා උසස් තත්ත්වයේ පාසලක අවශ්‍යතාව ඉටු කරලීමට අප පාසලට හැකි විය.

වර්තමානයේ ඉතා තරුණ නායකයෙකු වන, අධ්‍යක්ෂ නිකිත ග්‍රේරු මහතා විසින් පාලනය කෙරෙන අධ්‍යාපන ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන, වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසල, නව ජාත්‍යන්තර පාසල් රාශියක් අතර අසමසම පාසලක සාඩම්බර හිමිකාරීත්වයක් උසුලයි.



වර්තමානයේ පාසල විශාල පස්මහල් ගොඩනැගිලි 4කින් සමන්විත වන අතර එක් එක් මහල ඉඩකඩ සහිත පන්ති කාමර 10කින් සමන්විත වේ. බහු වාර්ගික ප්‍රජාවන්හි ළමුන් 5600 කට ආසන්න සංඛ්‍යාවක් මෙහි අධ්‍යාපනය ලබන අතර ප්‍රාථමික සිට පූර්ව ප්‍රාථමික අංශයේ සිට (උසස් පෙළ) දක්වා මනා පුහුණුව ලත් පළපුරුදු ගුරුවරු 750කට ආසන්න සංඛ්‍යාවක් ඉගැන්වීමේ කාර්යයෙහි නිරතව සිටිති. ප්‍රබෝධමත් ඉගැන්නුම් පරිසරයක් සහ මෙහෙයුම් ක්‍රියාවලියක් තුළින් පාසලෙහි තරුණ දූ පුතුන් හට එහි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ශක්තිය හා මඟ පෙන්වන පහන් ටැඹක් වී ක්‍රියා කරයි.

ශ්‍රේෂ්ඨ ග්‍රීක දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල්ගේ "ඔබවම හඳුනා ගන්න" යන ආදර්ශ පාඨය මූලික කරගනිමින් ලයිසියම් පාසල තුළට ප්‍රවේශ වන සෑම සිසුවෙකුටම සංස්කෘතික උරුමයන් පිළිබඳ පරිපූර්ණ, අනාගත ලොවට යෝග්‍ය අධ්‍යාපනයක් ලබා දීම ලයිසියම් ජාත්‍යන්තර පාසලෙහි අරමුණයි.

වසරක් පසා පැවැත්වෙන කේම්බ්‍රිජ් ඉගෙනුම් සම්මාන උළෙලේදී කැපී පෙනෙන දක්ෂතා පෙන්වා ජාත්‍යන්තර සම්මාන ලබා ගනිමින් පාසල වෙත ගෙන එන විෂය සමගාමී ජයග්‍රහණ වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසලට ගෞරවයකි. අපේ සිසුන්ට ගිණුම්කරණය, ඉංග්‍රීසි සාහිත්‍යය, ඉංග්‍රීසි, ගණිතය, ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය අතින් ලෝකයේ ඉහළම සහ ශ්‍රී ලංකාවේ ඉහළම සම්මාන හිමි කර ගැනීමට හැකි වීම ද සුවිශේෂ කරුණකි. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය පවත්වන අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී බොහෝ සිසුන් 2, 3 සහ 4 යන දිස්ත්‍රික් ශ්‍රේණිගත කිරීම් ද ලබා ගෙන ඇත.



සත්‍ය වශයෙන්ම ඉතා උසස් ප්‍රමිතියකින් යුත් සමබර අධ්‍යාපන පදනමකින් නැංගුරම් ලා ඇති ලයිසියම් වත්තල ඇතුළු ලයිසියම් පාසල් සියල්ලම නියෝජනය කරන බොහෝ සිසුන් ජාත්‍යන්තර මෙන් ම ජාතික විශ්වවිද්‍යාල තුළ ද විවිධ ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට සමත් වී ඇත. පසුගිය වසර කිහිපය තුළදී ලයිසියම් සිසුන් 100ක් පමණ කීර්තිමත් ජාතික විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශය ලබා ඇත. ලයිසියම් ස්ථානගත කිරීමේ ඒකකයේ සහයෝගය ඇතිව සිංගප්පූරුව, මැලේසියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය සහ ජර්මනිය යන රටවලට වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසලේ සිසු සිසුවියන් බොහෝ දෙනෙකුට උසස් අධ්‍යාපනය සඳහා සැලකිය යුතු ශිෂ්‍යත්ව ලබා ගැනීමට හැකි විය.



වත්තල ලයිසියම් සිසු සිසුවියන් ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් මාලාවකින් සමස්ත ලංකා මෙන් ම අන්තර්ජාතික පිළිගැනීම ද ලබා ඇත. විවිධ ක්‍රීඩාවලදී සිසුන් විසින් ප්‍රකට කරන ලද කැපී පෙනෙන දස්කම්හි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික වර්ණ ද ලබා ගැනීමට ඔවුන්ට හැකි වී ඇත. ලයිසිම් වත්තල ජාත්‍යන්තර පාසල වසර 13ක් අන්තර් ජාත්‍යන්තර පාසල් මලල ක්‍රීඩා ශූරතාවයේ සාඩම්බර හිමිකරුවා වන අතර එය අඛණ්ඩව වසර 12ක් සතු කර ගත් හ. අඛණ්ඩව වසර 8ක් ජාත්‍යන්තර පාසල් පිහිනුම් ශූරතාවයද, අඛණ්ඩව වසර 9ක් අන්තර් ජාත්‍යන්තර පාසල් කරාටේ ශූරතාවයද, සහ අඛණ්ඩව වසර 13ක් අන්තර් ජාත්‍යන්තර පාසල් ස්ක්‍රැබල් ශූරතාවයද වත්තල සතු කර ගත් හ.







විසි වසරක ජයග්‍රාහී අධ්‍යාපන ගමන් මඟක් සමරන මේ මොහොතේ ලයිසියම් ජාත්‍යන්තර පාසල ගෝලීය වසංගත තත්ත්වය හමුවේ වුවද නව මාර්ගගත ප්‍රවණතාවන් ඔස්සේ සිය අධ්‍යාපන මෙහෙවර අඛණ්ඩව පවත්වාගෙන යයි. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ සමස්ත අධ්‍යාපන යාන්ත්‍රණයට බාධා එල්ල වුව ද අධ්‍යක්ෂ නිකිත ග්‍රේරු මහතා විසින් ආරම්භ කරන ලද අපගේ අධ්‍යයන ක්‍රියාවලිය වගකිවයුතු පාසලක් වශයෙන් අපි කිසි විටෙකත් නතර නොකළෙමු. ලයිසියම් පාසල්වල විෂය මාලාව Microsoft Teams නම් මෘදුකාංගය මඟින් මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය යටතේ සාර්ථකව සිදු කිරීමට අපට හැකි වූ බැවින් ගෝලීය වසංගත තත්ත්වය තුළ ඉගෙනුම් ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ ප්‍රස්තාව සැලසිණි.



ලයිසියම් ජාත්‍යන්තර පාසල දැනුම, කුසලතා හා ආකල්පවලින් පරිපූර්ණ බුද්ධිමත් සුවිශේෂ පුද්ගලයන් බවට පත්වීම සඳහා සිසුන්ට උපකාර කිරීමේ අරමුණින් විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියක් සපයයි. විෂය පරිබාහිර වෙනත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම මඟින් මාර්ගගත පන්ති කාමරය තුළ ළමුන්ට ඇති විය හැකි ආතතිමය තත්ත්වයන්ගෙන් බැහැර වීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන අතරම, සිසු සිසුවියන්ගේ මනස ප්‍රබෝධමත්ව නව ශක්‍යතා පරාසයක් සඳහා විවෘත වීමද නිරායාසයෙන්ම සිදු වේ.

2020 සහ 2021 වර්ෂවල මුහුණ දුන් සියලු අභියෝග මධ්‍යයේ වුව ද වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසල් අඛණ්ඩ ව කැපී පෙනෙන ජයග්‍රහණ සමඟ ඉදිරියට යන්නේ, ජීවිතය යනු ගමනාන්තයක් නොවන නමුත් අනාගත ලෝකය භාර ගැනීමට සිටින පරපුරක් වශයෙන් තරුණ ආධ්‍යාත්මයන් පෝෂණය කරන ගමනක් බවත් සමාජයට මතක් කර දෙමිනි.









සෑම වසරකම, සෑම දිනකම, සෑම පැයකම නව මාවත් උදා කරමින්, දක්ෂ මඟ පෙන්වීමක් යටතේ ලඟා වියයුතු සීමා මායිම් පෙන්වූ නිහතමානී ගමන් මඟක සමාරම්භක නිර්මාතෘ ආචාර්ය මොහාන් ලාල් ග්‍රේරු මහතා, සම්බන්ධීකරණ විදුහල්පතිනි ආචාර්ය කුමාරි ග්‍රේරු මහත්මිය සහ අධ්‍යක්ෂ නිකිත ග්‍රේරු මහතා යටතේ අපට සෑම විටම ක්‍රියාව හා එහි හරය මහිමයට නැංවිය හැකි විය. අපේම ආරයකට, ශ්‍රී ලංකාවේ දීප්තිමත් අනාගතයක් උදා කරලීමට බලාපොරොත්තු බිඳක් අපි මෙයින් එක් කරන්නෙමු.